**නව තාක්ෂණය**

# එළවළු එන්නත්

මෙතෙක් අප දැන සිටියේ, නැත්නම් අසා තිබුණේ කටු එන්නත් සහ මුඛ එන්නත් විශේෂයන් දෙක පිළිබඳවයි. "එළවළු එන්නත්" ගැන ඔබ සිතන්නේ කුමක්ද?

යම් එළවළු වර්ගයක යූෂ සිලින්ජරයක් මගින් ශරීරගත කිරීමක් පිළිබඳව ඔබ අනුමාන කළේ නම් තව වරක් සිතන්න. ඔබ වැරදිය.

ඉතා පහසුවෙන් නිපදවියහැකිවූත් බෙදාහැරියහැකිවූත් නව එන්නත් විශේෂයක් නිව්යෝර්ක් නුවර ඉතාකාහි, පැළෑටි පර්යේෂණ සම්බන්ධ බොයිස් තොම්ප්සන් ආයතනයේ පැළෑටි ජීව විද්‍යාඥ **චාල්ස් ආර්න්ට්සන්** විසින් සොයාගෙන තිබේ.

ඔහුගේ මේ සොයාගැනීමට ඉවහල් කරගෙන ඇත්තේ අර්තාපල් ශාකයයි. ඔහු අර්තාපල් අලයේ ජානමය ප්‍රතිසංස්කරණයක් කර එම අල එන්නත් වශයෙන් රෝගීන්ට අනුභවකිරීමට සලස්වයි. මෙම නව "අල එන්නත" මගින් කොළරාව, හෙපටයිටිස්-බී රෝගය සහ මාරාන්තික ආහාර විෂවීම වැනි රෝග සඳහා ප්‍රතිශක්තියක් ශරීරය තුළ ඇතිකිරීමට හැකි බව **ආර්න්ට්සන්** පවසයි.

අර්තාපල් තුළ මෙලෙස උපද්දවන ප්‍රතිශක්තියට ඔහු ඊ කොලි (E . coli) යන නම දී තිබේ.

මීට වසර හයකට පෙර මේ පර්යේෂණ කටයුතු ඇරඹූ **ආර්න්ට්සන්** E. coli ජානයක් බේරාගෙන එය අර්තාපල් පැළෑටියක ඩී. එන්. ඒ. (DNA) අනුවකට බද්ධකර තිබේ. එම පැළෑටියෙන් ලත් අර්තාපල් අල අනුභව කළවිට ඉහතකී රෝගවලට ප්‍රතිදේහ ඒවා අනුභව කළ පුද්ගලයාගේ සිරුරේ වැඩෙන බව ඔහු සොයාගත්තේය.

මෙහිදී **ආර්න්ට්සන්ට** පැනනැගී ගැටලුව වූයේ මිනිසුන්ගේ ප්‍රතිශක්තිය උද්දීපනය කිරීමට තරම් ප්‍රමාණවත් E. coli ප්‍රමාණයක් අල ගෙඩියක් තුළ ජනිත කිරීමයි. ඒ සඳහා උපක්‍රමයක් යොදාගැනීමට සිතූ ආර්න්ට්සන් කෘත්‍රිම ජානයක් නිපදවීය. එමගින් රෝගියෙකුගේ සිරුරටවන් බැක්ටීරියාවක් නිපදවන ප්‍රෝටීන ප්‍රමාණයට සමාන ප්‍රතිදේහ ප්‍රෝටීන ප්‍රමාණයක් නිපදවිය හැකි අර්තාපල් අලයක් බිහිකර ගැනීම ඔහුගේ පර්යේෂණයේ ඊළඟ අභිප්‍රාය විය.

ස්වේච්ඡාවෙන් තෝරාගත් පුද්ගලයින් 14 දෙනෙකුට මේ "අර්තාපල් එන්නත්" අනුභව කිරීමට දුනවිට ඔවුන්ගේ ක්ෂුද්‍රාන්ත්‍ර සෛල සහ රුධිර නාලිකාවල මේ ප්‍රතිදේහ නිපදවෙන බව ඔහු දිටීය. මේ අන්දමට අපගේ ක්ෂුද්‍රාන්ත්‍රයේ (කුඩා බඩවැල) නිපදවෙන ප්‍රතිදේහ විශේෂයෙන් කොළරාව වැනි රෝග බෝකරන බැක්ටීරියා සහ වෛරසවලට එරෙහිව ප්‍රථමයෙන් සටන් කළ හැකි ආරක්ෂක බලඇණියක් ගොඩනගයි. කුඩා බඩවැල්වලට ප්‍රථමයෙන් ළඟාවීමේ හැකියාව ඇති ආහාර මාර්ගය ඔස්සේ කුස තුළට යැවෙන මේ "එළවළු එන්නත" අනෙකුත් එන්නත්වලට වඩා කාර්යක්ෂමතාවෙන් ඉහළය.

ආමාශදාහය හෙවත් ගැස්ට්‍රයිටිස්ට් (gastritist) රෝගය ලෙස හඳුන්වන රෝගයට මුල්වන නොර්වොක් (Norwalk) වෛරසයට එරෙහිව සටන්වැදිය හැකි මෙවැනිම අල එන්නත් නිපදවීමට **ආර්න්ට්සන්** දැන් වෙහෙසෙයි.

මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ලොව මවිත කරවන සුළු වුවද **ආර්න්ට්සන්**



මවිත වන්නේ වෙනත් අංශයකිනි. එනම් ඔහු පර්යේෂණ ආරම්භ කළේ කෙසෙල් ගෙඩි එන්නතක් අත්හදා බැලීමට වුවත් එය නිමාවූයේ අර්තාපල් එන්නතකින් වීම නිසයි. කෙසෙල් ශාකය ලොව දියුණුවෙමින් පවතින රටවල හොඳින් වැවීම පර්යේෂණ සඳහා මුලින්ම කෙසෙල් යොදා ගැනීමට ප්‍රධාන හේතුව වශයෙන් ඔහු දක්වයි. විශේෂයෙන්ම බොහෝ රටවල ළමුන් කෙසෙල්වලට ප්‍රියකරන නිසා ළමා රෝගවලට "කෙසෙල් එන්නත" ඉතා එලදායී විය හැකි බව ඔහුගේ මතයයි.

"මුඛ එන්නත් බෙදාහැරීමේ නව යුගයක් මේ සමඟ එළඹේවි. එය මට සතුටක්" ආර්ට්න්සන් අවසන් වශයෙන් පැවසීය.

**"ඩිස්කවරි" සඟරාව ඇසුරින් සකස් කෙළේ**
**ප්‍රියංකර**